සන්නස SANNASA

# හිනා මනා

## පට්ට ආච්චි

තමාගේ කටහඬ මහලු කාන්තාවකගේ කට හඬ බවට පරිවර්තනය කොට දුරකථන සංවාදයේ යෙදිය හැකි මෘදුකාංගයක් ආනන්ද තම ජංගම දුරකථනයට එක් කර ගත්තේය. ආනන්ද සමඟ ගනුදෙනු කරන ඇඟලුම් කර්මාන්තශාලාවක නිලධාරියෙක් වූ අනුර ඉරිදා නිවාඩු දිනයේ ආනන්ද දුරකථනයෙන් ඇමතූ විට ආනන්ද පිළිතුරු දුන්නේ මහලු කාන්තාවගේ කට හඬිනි.

අනුර : "හලෝ ආනන්ද ඉන්නවද ?"
ආච්චි : "මං ආනන්දගේ ආච්චි කතා කරන්නේ පුතේ. පුතා පොඩ්ඩකට එළියට ගිහිල්ලනේ. ෆෝන් එකත් දාලා ගිහිල්ලා."
අනුර : "හා කමක් නෑ ආච්චි මං පස්සේ කතා කරන්නම්"
ආච්චි : "එතකොට පුතා කතා කලේ මොකට ද? "
අනුර : "පොඩි වැඩක් කරගන්න ආච්චි"
ආච්චි : "මොකද්ද පුතේ පොඩි වැඩේ"
අනුර : "මේ පොඩි මේල් එකක් ආච්චි"
ආච්චි : "මොකද්ද පුතේ මේල් එක. පුතාගේ ජංගම එක ඔන් එකේ නම් මං බලන්නම්. මේ කොල්ල හැම තිස්සෙම මේකට පාස්වර්ඩ් දාලා තියෙන්නේ, මං ගේම් ගහනවා කියලා. හොඳ වෙලාවට ඔන් එකේ තියෙනවා. මේකේ මේල් එකවුන්ට් තුනක් තියෙනවානේ පුතේ. මොකද්ද දන් නෑ ගන්න ඕන."
අනුර : "ආ ආච්චි බලන්න WS කියන එකවුන්ට් එක"
ආච්චි : "හරි පුතේ තියෙනවා. ඒකෙ මොන මේල් එක ද එවන්න ඕන"
අනුර : "GM කියලා කෙනෙක්ගෙන් අන්තිමට ආපු මේල් එක එවන්න ආච්චි"
ආච්චි : "හරි හරි පුතේ ඔන්න එව්වා."

මද වේලාවකින් ආනන්ද අනුරට ඇමතුමක් ගත්තේ ය.

ආනන්ද : "ආ අනුර උඹ මට කෝල් එකක් අරන් තිබුණේ."
අනුර : "ආ ඒක මං උඹේ ආච්චි ලව්වා කරගත්තා. උඹට පට්ට ආච්චි කෙනෙක් ඉන්නේ. එයාට වයස කීය ද?"
ආනන්ද : "අවුරුදු අනූ පහක් විතර"
අනුර : "නැත් "

**ඔබගේ කෙටි රස කතාව අප වෙත එවන්න. මේ තීරයේ එය පළ කරන්නට අප සූදානම්.**

**විද්‍යුත් ලිපිනය:** chithran@sannasa.com.au

## Cartoon By SHANIKA SOMATILAKE




## රතන හිමිගේ උපවාසය

බළලුන් ලවා කොස් ඇට බාගෙන කෑම
මිනිහෙගෙ දුක් සමගින් - බැහැ එය නොකී යාම
දෙදහස් පහලොවෙන් ඒ සක්කඩ ගේම
සැලසුම් රනිල්මයි ලිවුවේ රහ සේම

අගමැති කම රනිල් හට අරගෙන දෙන්න
සංධානයේ හිමි සම්මිය වන සන්න
දීලා ලණුව සිරිසේනව ගෙන එන්න
'රතන සාදු' මුල් වීය පෙරමුණ ගන්න

'සහ සිවුරේ බලය' සක්කිලි යට පාවා
රතන සාදු උන් වෙනුවෙන් බඩ ගෑවා
කයිරාටික රනිල් ලොකු පුටුවට ආවා
ජනපති වෙන්න සිරිසේනට හැකි වූවා

උපවාසයට පෙර හමුවී - 'මහ දෙන්නා'
නැතිනම් 'මහා නායක' සමිඳුට දන්නා
තම කාරියේ නිවැරදි නාවය පෙන්නා
උපදෙස් නොපැතුවේ ඇයි - රට වීම සන්නා

'රජ සම ලබා දුන් හිමි' අද ඔබ නාහ
අමතක කලා - එහෙමයි ඒ හරි රෑහ
රනිල් නොමරී - කෝ එතකොට සිරි සේන
දළදා මැඳුර මාගෙන වත් නැහැ සේන

ජනපති මැඳුර - අගමැති හිල නිවස හරි
පාර්ලිමේන්තුව හෝ සිරිකොතට හරි
මේ උපවාස කාර්ය අරඹන්න බැරි
හේතුව රටට කතිකාවකි සැකය පිරි

ලොකු පුටු දෙකේ මහ දෙන්නා වැජ බෙන්නේ
රතන සාදුලා වගෙ උදවිය ගෙන්නේ
ආගම් බේද වපුරන්නයි අණ එන්නේ
උපවාසයට ඒකයි 'දළද' යන්නේ

මහ සංඝයා සහ බොදු පිරිවරගෙ බලේ
මේ නාටකය පෙන්නා එක පැහැට කලේ
මුස්ලිම් පිරිස් එහෙමයි ඔහු වියරු කලේ
කොහොමද රනිල් අගමැතිගේ ඊසිර මොලේ

ඇවිලෙන ජාති බේදෙට පෙට්‍රල් දමපු
මුස්ලිම් සමග මුළු රට විරසක කරපු
පැහැ රැක ගන්න අගමැති රහසෙම ලියපු
මේකත් හවත් නාටකයකි - අපි දැකපු

**ආනන්ද ගුණතිලක - හොපර්ස් ක්‍රොසිං**

